Page 2 October 2011.qxd 18/10/2011 16:16 Page 1

ලංකාවිත්ති
LANKA VITHTHI

LANKA VITHTHI
P. O. BOX 64678
LONDON NW3 9LS
ENGLAND

Phone **: 02074289388**
Fax **: 08719005163**
E-mail **: lanka.viththi @ virgin.net**

කර්තෘ : *දයා ආනන්ද රණසිංහ*
Editor **: Daya Ananda Ranasinghe**
චිත්‍ර : චන්දන සෙනෙවිරත්න
Art : Chandana Seneviratna
පරිගණක කටයුතු : චන්න කබ්රාල්
Computer Graphics : Channa Cabraal
ඡායාරූප : ආනන්ද කාරියවසම්
Photography : Ananda Kariyawasam



දුර සිටින දුක!

මෙය බොහෝ කලක සිට මට වැටහී තිබුණ එසේම මා ලියන්නට අදහස් කරගෙන සිටි දෙයකි. එය ලියන්නට හොඳම කාලය මේ නොබෝ දා පැමිණියේ ය.

පසුගිය මාසයේ ශ්‍රීලංකාවේ විසූ විශිෂ්ට පුද්ගලයින් තිදෙනෙකුගේ අභාවයන් සිදුවිය. එක පිට එක ඒවා වූයේ සති දෙකක් ඇතුළත දිය. වියත් ලේඛක, නවකතා, කෙටිකතාකරු, ප්‍රවීන සාහිත්‍යධර කේ. ජයතිලක ශ්‍රරීන් ද ප්‍රවීන ජනප්‍රිය සංගීතඥ විජයරත්න රණතුංග සහ මහා සිනමා නළු ජෝ අබේවික්‍රම යන තිදෙනය. මේ මහත්වරු මා හොඳින් දැන සිටි අය වෙති. ඔවුන්ගේ වියෝගයන් ඇසූ මනතින් මාතුළ උපන් සංවේගය, දුක, කණගාටුව අප්‍රමාණ වෙයි. එය තවමත් පවතී. එම දුක අප්‍රමාණයයි මා සඳහන් කළේ ඔවුන්ගේ අවමංගල්‍යයන්ට සහභාගිවන්නට නොහැකි වූ බැවිනි. මා මිත්‍ර අනුර හැගෙඩ ද එම කතාව ම මට කීවේය. අප වැනි තවත් විදේශයන්හි වසන සිංහළයින් දෙනෝදහසකට ද මේ සිත් තැවුල ඇතුවාට සැක නැත.

තම උපන් භූමියෙන් බැහැරව සිටීමේ විශාලතම අවාසනාව ලෙස මා දකින්නේ අපේ සහෘදයින්ගේ ප්‍රීතිමත් මොහොතකට හෝ ඔවුන්ගේ අවසන් ගමන සිදුවන විටක හෝ ඒ අසළ සිටින්නට නොහැකිවීමයි. තනි තනිව නොව ප්‍රීතිවන අය සමග හිඳ ප්‍රීතිවන්නටත්, ශෝකවන අය අතර හිඳ හඬා වැළපෙන්නටත් අපට අවශ්‍යය. සහෘද බැඳීම් යන්න එයින් ගම්‍ය වෙයි. එය නොමැති කල අප අපට උරුම සංස්කෘතියෙන් ගිලිහි, පෙකණි වැල කැපී ඉවතට විසිවුණු අය නේ දැයි අපගේ සිතට හැඟෙයි. ශාරීරිකව හා මානසිකව කලා ලෝකයේ ජීවත් වූ මට ඒ ශාරීරික බැඳීම මෙහි ආ දා ගිලිහි ගිය බව පැමිණි මුල් අවධියේ පටන් දැනී ගිය දෙයකි. මගේ ශෝකය ඉමහත් වන්නේ ද ඒ දැනීම නිසාය. එයට කල හැකි කිසිවක් ද නැති නිසා ය.

හැත්තෑවේ දශකයේ මහගම සේකර කලා කරුවාණන් මියගිය දවසේ එම ආදාහනයට අපි කිරිඳිවැළ ඔවුන්ගේ ගමට ඒ ගෙදරට ගියෙමු. එසේම අප මහා නිළිය, ගීත කෝකිලාව රුක්මණී දේවිය අවසන් ගමන් ගිය දා අවමඟුල් පෙරහැරේ ගිය සැටිද, අවමඟුල අවසන්වීත් දින කිපයක් රුක්මණීගේ පවුලේ අය සමග ඒ නිවසේ ගතකළ හැටි ද මට සිහිපත් වෙයි. ඒ සා බැඳීමක් කලාකරුවන් සමග තිබූ මට දැන් ඔවුන්ගේ අභාවයන් ඇසූ කල්හි ඒ අතීත ස්මරණය තුළ කිඳි දුක්වෙනු හැරෙන්නට වෙන කුමන විකල්පයක් ද?

කලාකරුවෙකු සාහිත්‍ය ධරයෙකු මියගිය කල්හි ඒ අඩුව පිරවිය නොහැකියයි බොහෝ අය කියන වදනේ සැබෑවක් ඇත. ඒ හැම කෙනෙක්ම අද්විතිය කෙනෙක් වෙති. සැබෑ කලා කුසලතා අනුකරණය කළ හැකි දේ නොවේ. කෙනෙකුට උත්පත්තියෙන්ම ලැබෙන දෙයකි. කේ. ජයතිලක, විජේරත්න සහ ජෝ යන තිදෙන අපේ කලාක්ෂේත්‍රයට ආලෝකය සහ අපේ ජන ජීවිතවලට ප්‍රාණයද නොඅඩුව දුන්හ. ඈත සිට ඔවුන් ගැන වචනයක් හෝ මෙසේ ලියන්නට ලැබීම සිතට සැහැල්ලුවකි.

ආඝාත පටිවිනය සූත්‍රය

පූජ්‍ය හොරණ වජිරඤාණ ස්වාමීන් වහන්සේගේ (99-07-04 ඉරුදින) ධර්මදේශනාවක් ඇසුරෙනි

ආඝාත පටිවිනය නම් වෛරය, ද්වේෂය සිතින් පහකර ගැනීමයි. යම් කෙනෙකු හෝ යම් සිදුවීමක් ගැන තම සිත තුළ ඇතිවූ වෛරය, ද්වේෂය පහකර ගත හැකි ක්‍රම පහක් ඇත.

1. ඒ පුද්ගලයා කෙරෙහි මෛත්‍රිය දියුණුකර ගැනීම.
2. ඒ පුද්ගලයා කෙරෙහි කරුණාව දියුණුකර ගැනීම.
3. ඒ පුද්ගලයා කොරෙහි උපේක්ෂා සහගත සිතුවිලි ඇතිකර ගැනීම.
4. ඒ පුද්ගලයා ගැන නැව නැවත සිහි නොකර අමතකකර දැමීම.
5. ඒ පුද්ගලයාගේ පෙර කර්මය නිසා මෙසේ හැසිරෙන බව සිතීම.

ද්වේශය නිසා කෙනෙකුගේ සිත තැවෙන්නට පටන් ගනී. ආඝාතය සිත තුළ පහළ වන ආකාරය **9** විධ වේ. නව ආඝාත වස්තු යනුවෙන් ඒවා හැඳින් වෙයි.

1. යමෙක් තමන්ට පෙර අවැඩක් කළායයි සිතීම.
2. යමෙක් තමන්ට දැන් අවැඩක් කරනවායයි සිතීම.
3. යමෙක් අනාගතයේදී තමන්ට අවැඩක් කරනු ඇතැයි සිතීම.
4. යමෙක් තම හිතවතාට පෙර අවැඩක් කළා යයි සිතීම.
5. යමෙක් තම හිතවතාට දැන් අවැඩක් කරනවා යයි සිතීම.
6. යමෙක් තම හිතවතාට ඉදිරියේදී අවැඩක් කරනු ඇතැයි සිතීම.
7. යමෙක් තම විරුද්ධකාරයාට යහපතක් පෙර කළා යයි සිතීම.
8. යමෙක් තම විරුද්ධකාරයාට දැන් යහපතක් කරනවා යයි සිතීම.
9. යමෙක් තම විරුද්ධකාරයාට ඉදිරියට යහපතක් කරනු ඇතැයි සිතීම.

මෙම නව ආඝාතයට අස්ථාන ක්‍රෝධය ද එකතුවූ විට දශ ආඝාතයක් වෙයි. අස්ථාන ක්‍රෝධය නම් හදිසියේ ඇතිවන ක්‍රෝධයයි. ඇතැමුන් තුළ වැස්සට, අව්වට, සුළඟට, ශීතලට පවා ක්‍රෝධය ඇතිවෙයි. ඒ අස්ථාන හෙවත් නුසුදුසු හේතුවක් නැති ක්‍රෝධයයි.

කෙනෙකු තුළ කෝධයක් හටගත් විට ඉන් ඔහුට හානියක් සිදුවෙයි. තමාගේ අගුණයක් කියන විට හිත දූෂණය කර නොගෙන එය ඇත්ත ද කියා සොයා බැලිය යුතු ය. එසේම තමාගේ ගුණ කවුරුන් හෝ කියන විටද අනවශ්‍ය සතුටක් ඇතිකර නොගත යුතුය. එය ඇත්ත නම් ඇත්ත බව පමණක් පිළිගත යුතුය. ක්‍රෝධය තමන්ටත් අනුන්ටත් ඉතා හානිකර වෙයි. ක්‍රෝධ කරන්නාගේ ශරීරය දුර්වර්ණය. ඔහු නිතර දුකසේ වෙසෙයි. ඔහු දැකීමට කිසිවෙකු කැමති නැත. නෑ හිත මිතුරෝ හැමදෙනම ඔහු වර්ජනය කරති. ඔහුට යහපත හෝ අයහපත නොතේරේ. එය මහා ඝන අඳුරකි. ඔහු තම මව්පියන් වුනත් මරා දමන්නට හැකි කෙනෙකි. කෙනෙකුගේ සිත තුළ ඇති කෝධය ඔහු කොතෙක් නොපෙන්වා සිටියත් යම් අවස්ථාවලදී එය ඉතා නපුරු විදියට මතුවිය හැකිය. අරමුණක් ඇතිව හෝ නැතිව අපේ සිතින් ක්‍රෝධය ඉවත්කර ගත යුතුය.

වෛරක්කාරයාට වෛර කිරීමෙන් එහි කෙළවරක් නොවේ. සිත තුල වූ ක්‍රෝධය මතු වූ අවස්ථාවක් දැක්වෙන කතා පුවතක් මෙසේය.

පෙර දඹදිව වේදේහිකා නම් සිටු කුමරියක් වූවා ය. ඇය ඉතා ඉවසිලිවන්ත අයෙකු ලෙස බොහෝ දෙනා අතර ප්‍රසිද්ධ වී තිබුණි. ඇයට කාලී නම් දාසියක් සිටියා ය. තම ස්වාමි දුව ඇත්ත වශයෙන්ම ඉවසිලිවන්ත දැයි දැනගැනීමට කාලියට අවශ්‍ය වීය. දිනපතා වේලාසනින් අවදි වී ගෙදර දොර වැඩකටයුතු කලට වේලාවට නිසිලෙස ඉටුකරමින් සිටි කාලිය දිනක් හිතා මතාම මඳක් ප්‍රමාද වී අවදිවූවා ය. එදින තම ස්වාමි දියණිය වූ වේදේහිකාවගේ මුහුණෙයි වෙනදා තිබුණු ප්‍රියමනාප ගතිය නොවිණි. කාලිය ඒ බව හොඳින් දුටුවා ය.

දෙවෙනි දින ඇය තවත් ටිකක් ප්‍රමාද වී අවදිවූවාය. එදින ස්වාමි දුව ඇයට බැන වැදුනාය. තුන් වැනි දින කාලිය තවත් ප්‍රමාද වී අවදි වූවාය. එදා ස්වාමි දුව පොල්ලකින් ගසා කාලියගේ හිස පැලුවා ය.

නොපෙන්වා සිටියත් වේදේහිකාව තුළ වූ ක්‍රෝධය එසේ නපුරු විදියට මතුවිය. එබැවින් මෙසේ සිතන්න. ක්‍රෝධය කිසිසේත් හොඳ දෙයක් නොවේ. එනිසා අප සිත් තුළින් ක්‍රෝධය ඉවත්කර ගත යුතුය.

පූජ්‍ය හොරණ වජිරඤාණ ස්වාමීන් වහන්සේගේ ධර්මදේශනාවක් ඇසුරෙන් වසර කීපයකට පෙර මෙම ලිපිය ලංකා විත්තියට සකස් කර එව්වේ -

♦ විශ්‍රාමලත් විදුහල්පතිනි, අභාවප්‍රාප්ත ප්‍රේමා අදිකාරි මහත්මියයි

පියුම් විල

උපුල් විලක හෝ පියුම් විලක තුන් ආකාරයක මල් දක්නට ලැබේ.
දිය යට වැඩුණු, දියෙන් මතු නොවූ මල් ඇත. දිය යට හටගෙන දිය මට්ටමේදී පිපිණු මල් ඇත. දිය යට හටගෙන, දියෙහි වැඩී දියෙන් උඩට නැගුණු මල් ඇත.

එම ජලජ පුෂ්පයන් වැනි පුද්ගලයෝ තිදෙනෙක් ලොව වෙසෙති.

ඇතැමෙක් කෙලෙස් බහුලය. කෙලෙස්හිම ඇලී ගැලී වෙසෙති.

ඇතැමෙක් ලෞකිකත්වය තුළ හැදී වැඩී ලෝකය මතු පිටට පැමිණියෝ වෙති.

ඇතැමෙක් ලෞකිකත්වය ඉක්මවා ලෝකෝත්තර තත්වයට පත්වූවෝය. (මහා පාලිය)

♦ පූජ්‍ය පොරොවගම ඤාණසිරි හිමි -සුසිලාරාමය බඹරවාන Sri Lanka

❊ නව සහශ්‍රයට ධර්මානුශාසනා ❊

හිතොපදේශයෙන්

යාත්‍යධොඅධො ව්‍රජත්‍යුචෛර් - නරථ සෛවරෙව කර්මභිඃ
කූපස්‍ය බනිකා යද්වත් - ප්‍රාකාරස්‍යෛව කාරකඃ

අර්ථය : **මිනිසා තමා කරන අයහපත් කටයුතු නිසා තත්ව යෙන් පහතට වැටේ. උසස් ක්‍රියාවන් හේතුකොට ගෙන හේ උතුම් බවට පත්වේ. ළිඳක් හාරන්නෙකු හා ප්‍රාකාරය කරන්නෙකු මෙනි.**

ලොව පුද්ගලයා පහත් දේ කිරීමෙන් පහළට වැටෙන බවත්, උසස් ක්‍රියාවන් කිරීමෙන් උතුම් බවට පත්වන බවත් මෙම පද්‍යයෙන් දෙන ආදර්ශයයි. මෙය ලොව ඕනෑම සමාජයකට කදිමට ගැලපෙන්නකි. විශේෂ යෙන් කර්මඵල විශ්වාස කරන ඕනෑම ආගමකට ද අදාළ ය.

බුදු දහමට අනුව කෙනෙකු උසස් පුද්ගලයෙකු වන්නේත්, පහත් මිනිසෙකු වන්නේත් ජාතියෙන් ජන්ම යෙන් නොව ඔහු හෝ ඇය කරන ක්‍රියාවන්ගෙනි. වපුරන දෙයට අනුව අස්වැන්න නෙලා ගැනීම සිදුවෙයි. නජච්ඡා වසලො හොති යන ප්‍රකට ගාථාවේ අරුත එයයි.

සමාජ අසම්මත දුසිරිත් කරන්නා පහත් තත්වයට ඇද වැටෙන බවත්, සමාජයෙන් නින්දා ගැරහුම් අපවාදවලට ලක්වන බවත්, සමාජ සම්මත ආචාර ධර්ම සුරකින සුචරිතවත් පුද්ගලයා සමාජයෙන් පැසසුම් ලබමින්, කිතුගොස නංවමින්, බුහුමන් ලබන බවත්, එවන් අය සමාජයේ උසස් තලයට සමාජය විසින්ම ඔසවා තබන බවත්, සමාජ හා ලෝක ධර්මතා උල්ලංඝණය කරමින් දුසිරිතෙහි යෙදෙන්නා සමාජයේ පහළ තලයට ඇද වැටෙන බවත් කවුරුත් දන්නා කරුණකි.

මෙම පද්‍යයට අනුව එම තත්වයන්ට පත්වන්නේ තම තමන් විසින්ම බව උපමා දෙකකින් පැහැදිලි කෙරේ. ඔබ යම් පරිහා නියක් හෝ දියුණුවක් ලබා තිබේ නම් ඒ සියල්ලේ පිටුපස තිබෙන්නේ ඔබේ ක්‍රියාකාරකම්ය. සම හර අය හිතන්නේ තම දියුණුව හෝ පරිහානිය පවතින්නේ සමාජ ක්‍රමය මත කියාය. නමුත් ඒ හැම තැනකම කෙනෙකු ක්‍රියාත්මක නොවුනහොත් හොඳ හෝ නරක ප්‍රතිඵල ඒ තැනැත්තාට හිමිවන්නේ නැත. ළිඳක් කණින්නාට හැරීමේ ගැඹුර වැඩිවන තරමට ක්‍රමයෙන් පහළට යාමට සිදුවෙයි. ඒ වගේම ප්‍රාකාරයක් බඳින්නා එය බැඳීමේ උස වැඩිවන තරමට එයත් සමග ඉහළට යයි.

අනෙක් අතට බලන විට අධ්‍යාත්මික ගුණධර්ම වලින් පිරිහී අකටයුතුකම් කරන පාපී පුද්ගලයා ලෞකික ජීවිතය අඳුරු කරගන්නාක් මෙන්ම අපායගාමී ද වේ. උපමාවේ ළිදේ පතුලට බැසීම යනුවෙන් අදහස් කරන්නේ ද එයයි. එමෙන්ම අධ්‍යාත්මික දියුණුව පතා උසස් ගුණධර්ම පෝෂණය කරන්නා ඉහළට යනවා යනුවෙන් අදහස් කරන්නේ ස්වර්ගගාමී වීමයි. ලෝකෝත්තර තත්වයට පත්වීමයි.

ඇතැම් අය කරන වැරදිවලට විපාක ඇස්පනාපිටම විඳීමට සිදුවන බව අප කාටත් පැහැදිලි කරුණකි. මිනීමැරුම්, මංකොල්ලකෑම්, දූෂණ වංචා, පැහැරගැනීම් වැනි බිහිසුණු අපරාධකරන්නෝ ඒ මොහොතේ සිටම ඒවාට විපාක විඳිති. එහි විපාක ලෙස සිතෙන් දැවෙමින් තැවෙමින්, වධ බන්ධනවලට ගොදුරු වෙමින්, සමාජයෙන්ද ගැරහුම් ලබමින්, පරිහානියට හා ජීවිතයේ අඳුරු අගාධයට ඇද වැටෙති. හරියට ළිඳ කණින්නා මෙනි.

උසස් ගුණධර්ම සපුරණ සත්පුරුෂයා සමාජයෙන් පිදුම් ලබමින් ජීවිතාලෝකය ලබමින් ප්‍රකාරයක් ඉදිකරන්නා ඉහළට ඉහළට යන්නාක් මෙන් ක්‍රමයෙන් ශ්‍රේෂ්ඨත්වයට පත්වන්නේ ය.

♦ රාජකීය පණ්ඩිත - ශාස්ත්‍රපති
පූජ්‍ය විල්ඔය විමලජෝති හිමි
ලන්ඩන් බෞද්ධ විහාරය

NORMA & Co
Associate Solicitors

2 Queens Parade
Green Lanes, London N8 0RD
Tel. 020 8348 7772 / 07717173414

Any type of Visa Applications
Car Accidents

Colombo Office

Visa Applications & Any Refusals
100/6 Rosemead Place
Colombo 7
Tel. 2672432 / 0777686632